# සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ වනිතා කටයුතු අමාත්‍යාංශය
# සබරගමුව පළාත් සභාව

**<u>අපගේ සේවාවන්</u>**

| | සේවාව | ඉදිරිපත් කල යුතු ලේඛන/ සපුරා ලිය යුතු සුදුසුකම් |
|---|---|---|
| | | **ආයතන කටයුතු** |
| 01 | බලය පවරනු ලැබූ තනතුරු සඳහා පුරප්පාඩු ඇතිවන අවස්ථා වල පත්වීම් කිරීම (ඒකාබද්ධ සේවයේ නොවන සෞඛ්‍ය හා ආයුර්වේද දෙපාර්තමේන්තුගත ආදේශක/ කොන්ත්‍රාත් පදනමේ කම්කරු, සනීපාරක්ෂක කම්කරු හා ස්ථිර කම්කරු ශ්‍රේණි) | • අදාල ව්‍යවස්ථාවේ දැක්වෙන අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම්<br>• තිබෙන පුරප්පාඩු ප්‍රමාණය අනුව සීමා වේ. |
| 02 | ස්ථාන මාරු (අන්තර් පළාත් හා සුහද) | • ආයතන ප්‍රධානියා, ප්‍රාදේශීය ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිත අයදුම්පත (පිටපත් 03)<br>• නිශ්චිත කාල සීමාවක අති දුෂ්කර/ දුෂ්කර/ ප්‍රියමනාප සේවා ස්ථාන වල සේවය<br>• අනුප්‍රාප්තික විධිවිධාන තිබීම |
| 03 | සේවය ස්ථිර කිරීම | • පත්වීම් ලිපියේ පරිදි පරිවාස කාලය තුල සතුටුදායක සේවා කාලය<br>• කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ ලිපිය<br>• පත්වීම් ලිපිය, ශිෂ්‍ය කාර්ය දර්ශණය, චර්යා සටහන්, රාජකාරී භාර ගැනීමේ ලිපි, එන්නත් ප්‍රවීනතා ලිපි වල සහතික කල පිටපත්<br>• විභාග ප්‍රතිඵල සනාථ කිරීමේ ලිපි<br>• බලය දීමේ ආකෘතිය<br>• 1, 2, 3 වාර්ෂික වාර්තා<br>• ආයතන ප්‍රධානියා, ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් නිර්දේශ සහිත දීප ව්‍යාප්ත සේවාවන් සඳහා අදාල පත්වීම් බලධාරියා වෙතද අනෙකුත් පත්වීම් සඳහා රා.සේ.කො. වෙතද ඉදිරිපත් කිරීම සඳහා අයදුම්පත් |
| 04 | ඒ ඒ ශ්‍රේණි වලට උසස් කිරීම | • ආයතන ප්‍රධානියා, ප්‍රාදේශීය ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිත අයදුම්පත<br>• සේවය ස්ථිර කිරීමේ ලිපිය<br>• පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය<br>• කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ ලිපිය<br>• මුල් පත්වීම් ලිපිය |
| 05 | සේවය දීර්ඝ කිරීම | • ආයතන ප්‍රධානියා, ප්‍රාදේශීය ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිත අයදුම්පත (අවුරුදු 57 ඉක්මවා දීර්ඝ කිරීම් විශ්‍රාම ගැන්වීමට නියමිත දිනට මාස 06 කට ප්‍රථමද ඉන් ඔබ්බට දීර්ඝ කිරීම් මාස 03 කට ප්‍රථමද එවිය යුතුයි) |
| 06 | විශ්‍රාම ගැන්වීම | • ආයතන ප්‍රධානියා, ප්‍රාදේශීය ප්‍රධානියා, |

| | | |
|---|---|---|
| | | දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිත අයදුම්පත(විශ්‍රාම ගැන්වීමට මාස 03 කට ප්‍රථම එවිය යුතුය) |
| 07 | 1. විදේශ නිවාඩු අනුමත කිරීම (පෞද්ගලික වියදමින් යන ගමන්) | • පොදු 126 අයදුම්පත්‍රය (පිටපත් 03)<br>• ගමන් බලපත්‍රයේ පිටපතක්<br>• වැඩ ආවරණ විධිවිධාන සමග ආයතන ප්‍රධානියා, ප්‍රාදේශීය ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිත ලිපිය |
| | 2. විදේශ ගමන් අනුමත කිරීම (රාජකාරී ගමන්) | • ශිෂ්‍යත්වය/ වැඩසටහන සඳහා තෝරා ගත් බව හා දීමනා/ ගෙවීම් පිලිබඳ තහවුරු කෙරෙන ලිපිය<br>• වැඩ ආවරණ විධිවිධාන සමග ආයතන ප්‍රධානියා, ප්‍රාදේශීය ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සමග පොදු 126 අයදුම්පත්‍රය (පිටපත් 04)<br>• ආයතන සංග්‍රහයේ 16 වැනි පරිශිෂ්ඨය යටතේ විදේශගත වීම සඳහා අවසර ගැනීමේ ඉල්ලුම්පත්‍රය |
| 08 | භාෂා ප්‍රවීනතා දීමනා ගෙවීම | • ආයතන ප්‍රධානියා, ප්‍රාදේශීය ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිත අයදුම්පත<br>• සේවය ස්ථිර කිරීමේ ලිපිය<br>• අදාල භාෂා මාධ්‍යය සමත් බවට සහතික<br>• වාචික පරීක්ෂණ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම/ සමත් බවට සහතික කරන ලිපි |
| 09 | 1. විනය ක්‍රියාමාර්ග ගැනීම - මූලික විමර්ශණ | • මූලික විමර්ශණ වාර්තාව හා කෙටුම්පත් චෝදනා පත්‍රය |
| | 2. විනය ක්‍රියාමාර්ග ගැනීම - විධිමත් විනය පරීක්ෂණය | • විධිමත් විනය පරීක්ෂණ වාර්තාව |

| | සේවාව | ඉදිරිපත් කල යුතු ලේඛන/ සපුරා ලිය යුතු සුදුසුකම් |
|---|---|---|
| | **සංවර්ධන හා ගිණුම් කටයුතු** | |
| 01 | සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා අනුමැතිය | • අදාල යෝජනා නියමිත කාලය තුල අමාත්‍යාංශයට එවීම<br>• අමාත්‍යතුමා ප්‍රමුඛ කමිටුවේ නිර්දේශය<br>• ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය |
| 02 | රු.මි. 10 දක්වා වැඩ සහ රු.මි.05 දක්වා සැපයුම් සේවා සඳහා ටෙන්ඩර් කැඳවීම් සමග ටෙන්ඩර් මණ්ඩල කටයුතු | • අදාල ඇස්තමේන්තු හා සැලසුම්<br>• මිල කැඳවීම්/ ටෙන්ඩර් පත්<br>• සැපයීම් සම්බන්ධයෙන් වන විට භාණ්ඩ පිරිවිතර ලැයිස්තු<br>• ඇගයීම් මණ්ඩල වාර්තා<br>• අනුඥාත ලිපිය |
| 03 | ටෙන්ඩර් පත් නිකුත් කිරීම | • අදාල ටෙන්ඩර් කැඳවීම් ලිපි වල නියමිත වටිනාකම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් සබරගමුව පළාත් සභාවේ ලියාපදිංචි වී ඇති සහතිකය<br>• ජාතික හැඳුනුම්පත<br>• නියමිත ටෙන්ඩර් පෝරම ගාස්තු |
| 04 | ටෙන්ඩර් පත් භාර ගැනීම | • අමාත්‍යාංශයෙන් ලබාගෙන නියමිත ආකෘතියේ විධිමත්ව සම්පූර්ණ කල ටෙන්ඩර් පත්‍රිකාව<br>• සැපයුමක් නම්, සැපයුම් භාණ්ඩ හා මිල පිලිබඳ විස්තර<br>• අදාල ටෙන්ඩරයේ වටිනාකම තහවුරු කරන බැංකු |

| | | |
|---|---|---|
| | | ලංසුකරය |
| 05 | අනුඥාත නිවේදන නිකුත් කිරීම | • අදාල වැඩ විෂය සැපයුම් සේවාව සැලැස්මට ඇතුලත්ව තිබීම<br>• මූල්‍ය ප්‍රතිපාදන තිබීම<br>• අනුමත ඇස්තමේන්තුව ඇතුලත් ලිපි ගොනුව |
| 06 | ඉදිකිරීම් කොන්ත්‍රාත් වැඩ බිල්පත් ගෙවීම (කොටස් මුදල් ගෙවීම) | • නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ (ඉංජිනේරු සේවා) /අදාල බලධාරියාගේ අනුමැතිය<br>• ප්‍රමාණ පත්‍රය<br>• DE 14 වාර්තාව<br>• නියමිත වටිනාකමට මුද්දර අලවා කොන්ත්‍රාත්කරු විසින් අත්සන් කල පොදු 35 වවුචරය |
| 07 | ඉදිකිරීම් කොන්ත්‍රාත් වැඩ අවසන් කොටස් මුදල් ගෙවීම | • නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ (ඉංජිනේරු සේවා) /අදාල බලධාරියාගේ අනුමැතිය<br>• ප්‍රමාණ පත්‍රය<br>• වැඩ අවසන් වාර්තාව<br>• DE 14 වාර්තාව<br>• නියමිත වටිනාකමට මුද්දර අලවා කොන්ත්‍රාත්කරු විසින් අත්සන් කල පොදු 35 වවුචරය |
| 08 | ඉදිකිරීම් කොන්ත්‍රාත් වැඩ රඳවුම් මුදල් ගෙවීම | • නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ (ඉංජිනේරු සේවා) /අදාල බලධාරියාගේ අනුමැතිය<br>• DE 14 වාර්තාව<br>• DE 16 (රඳවුම් මුදල් ආපසු ගෙවීම්) වාර්තාව<br>• ඉදිකිරීම අයත් ආයතන ප්‍රධානියාගේ සහතිකය<br>• නියමිත වටිනාකමට මුද්දර අලවා කොන්ත්‍රාත්කරු විසින් අත්සන් කල පොදු 35 වවුචරය |
| 09 | සැපයුම් සහ සේවා බිල්පත් ගෙවීම් කිරීම | • සැපයුම අදාල වන ආයතනභාර ප්‍රධානියාගේ ගෙවීම් අනුමැතිය<br>• ටෙන්ඩර් මණ්ඩල තීරණය<br>• සපයන ලද භාණ්ඩ විස්තර<br>• බිල්පත් හා භාණ්ඩ භාරගත් බවට දෙපාර්තමේන්තු බලධාරීන්ගේ සහතිකය<br>• සපයන ලද භාණ්ඩ අනුමත පිරිවිතරයන්ට හා ටෙන්ඩර් මණ්ඩල තීරණ වලට සරිලන බවට ටෙන්ඩර් මණ්ඩල /ඇගයීම් මණ්ඩල සහතිකය |

| | සේවාව | ඉදිරිපත් කල යුතු ලේඛන/ සපුරා ලිය යුතු සුදුසුකම් |
|---|---|---|
| | **වනිතා කටයුතු** | |
| 01 | මාතෘ මූලික පවුල් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම | • සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව)<br>• ස්වාමිපුරුෂයා මියගොස් නම් මරණ සහතිකයද, රෝගීව සිටී නම් විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් හෝ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ද , අතහැර ගොස් නම් එය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරීගෙන් ලබා ගත් ලිපියක්<br>• ඔබ විසින් කරගෙන යාමට අපේක්ෂිත ස්වයං රැකියාව පිළිබඳ දළ විස්තරයක් හා ස්වයං රැකියාව සඳහා අදාල වන ඇස්තමේන්තුව<br>• ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් |

| | | |
|---|---|---|
| | | • ලේකම්, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය හා වනිතා කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව , රත්නපුර නමින් ඔබගේ අවශ්‍යතාවය සඳහන් ඉල්ලීම් ලිපියක්<br>• ස්වයං රැකියාව පිළිබඳ පුහුණුවක් ලබා ඇත්නම් එය සනාථ කිරීමට ලද සහතික වල ඡායා පිටපත් |
| 02 | කාන්තාවන් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම | • සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව)<br>• වයස අවුරුදු 18 -50 අතර කාන්තාවක් වීම<br>• ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්<br>• ඔබ විසින් කරගෙන යාමට අපේක්ෂිත ස්වයං රැකියාව පිළිබඳ දළ විස්තරයක් හා ස්වයං රැකියාව සඳහා අදාල වන ඇස්තමේන්තුව<br>• ලේකම්, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය හා වනිතා කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව , රත්නපුර නමින් ඔබගේ අවශ්‍යතාවය සඳහන් ඉල්ලීම් ලිපියක්<br>• ස්වයං රැකියාව පිළිබඳ පුහුණුවක් ලබා ඇත්නම් එය සනාථ කිරීමට ලද සහතික වල ඡායා පිටපත් |
| 03 | වනිතා සමිති දිරි ගැන්වීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති ආධාර ලබාදීම | • ලියාපදිංචි කාන්තා සමිතියක් වීම<br>• අදාල කාන්තා සමිතිය මගින් ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘතියක් වීම<br>• ප්‍රාදේශීය ලේකම් අනුමත කරන ලද ව්‍යාපෘතියක් වීම |
| 04 | වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම | • අධ්‍යාපන සුදුසුකම් ( 08 වසර සමත් වීම)<br>• වයස අවුරුදු 18 -50 අතර කාන්තාවන් වීම<br>• දැනට ස්වයං රැකියාවක නිරත වන කාන්තාවන් සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. |